# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 639 / 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திக / Date — 14/04/2024 පැය 0825

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මාරක රිය අනතුරක් - නිවිතිගල පොලිස් වසම.**

2024.04.13 වන දින සවස් කාලයේ නිවිතිගල පොලිස් වසමේ රත්නපුර කලවාන මාගර්යේ නිවිතිගල නගරය ආසන්නයේදී කලවාන දෙස සිට නිවිතිගල දෙසට ධාවනය වූ වෑන් රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු නිවිතිගල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රථිකාර සඳහා රත්නපුර රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 16 ක් වූ නිරිඇල්ල වත්ත, නිවිතිගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රත්නපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. නිවිතිගල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - රඹුක්කන පොලිස් වසම.**

2024.04.13 වන දින සවස් කාලයේ රඹුක්කන පොලිස් වසමේ කොටවැල්ල මීදෙනියවත්ත මාගර්යේ හිගුරුවක ප්‍රදේශයේදී මීදෙනියවත්ත දෙස සිට කොටවැල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාගර්යෙන් ඉවතට පැන බැම්මකින් පහලට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු රඹුක්කන රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ හේවාදිවෙල , රඹුක්කන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රඹුක්කන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර රඹුක්කන පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - හම්බන්තොට පොලිස් වසම.

2024.04.13 වන දින සවස් කාලයේ හම්බන්තොට පොලිස් වසමේ කොළඹ වැල්ලවාය මාගර්යේ 08 කණුව ආසන්නයේදී හම්බන්තොට දෙස සිට තිස්ස දෙසට ධාවනය වූ යතුරු පැදියක එම දෙසටම පිටුපසින් ගමන් ගත් කාර් රථයක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකාරිය හා පසුපැදිකාරිය හම්බන්තොට රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පසුපැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 57ක්වූ තිස්සමහාරාමය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හම්බන්තොට රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ කාර් රථය පැදවූ කාන්තාව අත්අඩංගුවට ගෙන ඇත. හම්බන්තොට පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කායර්ාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**